නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන,
පර්යේෂණ හා නව නිපැයුම්
රාජ්‍ය අමාත්‍යාංශය

# NAITA

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය

**මෙම අධිකාරියේ පහත සඳහන් තනතුර සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ**

# අධ්‍යක්ෂ (තත්ත්ව තනතුර)

## සුදුසුකම් හා පළපුරුද්ද

බාහිර අයදුම් කරුවන් සඳහා (පහත 01. හෝ 02. ) :

01. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක ඉංජිනේරු / තාක්ෂණවේදි / තාක්ෂණ හා වෘත්තීය අධ්‍යාපන/ විද්‍යා / කෘෂිකර්ම / ගණිත පිළිබඳ උපාධියක් ලබා තිබීම.

**සමග**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක ඉංජිනේරු / තාක්ෂණවේදි /අධ්‍යාපන / විද්‍යා / කෘෂිකර්ම / ගණිත / කළමනාකරණ පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම **හෝ** පිළිගත් වරළත් වෘත්තීය ආයතනයක /ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ඉහත විෂය ක්ෂේත්‍රයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

**සහ**

රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක /මණ්ඩලයක හෝ පිළිගත් ආයතනයක අදාල ක්ෂේත්‍රයේ වසර 15 ක කළමනාකරණ මට්ටමේ පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද

02. පිළිගත් වරළත් වෘත්තීය ආයතනයක ඉහත විෂය ක්ෂේත්‍රයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම

**සහ**

රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක /මණ්ඩලයක හෝ පිළිගත් ආයතනයක 15 ක කළමනාකරණ මට්ටමේ පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද

**අභ්‍යන්තර අයදුම් කරුවන් සඳහා** (පහත 01. හෝ 02. ):

01.ඉහත බාහිර අයදුම් කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර තිබීම

02.ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ කළමනාකරණ (MM 1-1) කාණ්ඩයේ 01 වන ශ්‍රේණියේ හෝ/ සමග අධ්‍යයන හා පර්යේෂණ කාණ්ඩයේ (AR-1) 01 වන ශ්‍රේණියේ වසර පහක (05) ක සතුටුදායක සේවයක් සම්පූර්ණ කර තිබීම **හෝ** ජ්‍යෙෂ්ඨ අධ්‍යයන හා පර්යේෂණ කාණ්ඩයේ (AR-2) තනතුරක අදාල ක්ෂේත්‍රයේ වසර පහක (05) ක සතුටුදායක සේවයක් සම්පූර්ණ කර තිබීම

**වැටුප -** කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 (i) අනුව

රුපියල් **80,295 - 15 x 2,270 - 114,345 (HM 1-1)**
(අමතරව රජය මගින් අනුමත දීමනා සඳහා හිමිකම් ලබයි)

**භාණ්ඩාගාර චක්‍රලේඛ අනුව ප්‍රවාහන පහසුකම් සහ දුරකථන දීමනා සඳහා හිමිකම් ලබයි.**

**වයස් සීමාව:** වයස අවුරුදු 35- 55 අතර විය යුතුය
**(අභ්‍යන්තර කාර්ය මණ්ඩලයේ අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බලනොපැවැත්වේ)**

## අදාල කොන්දේසි :

දැනට රාජ්‍ය සංස්ථා ව්‍යවස්ථාපිත මණ්ඩල සහ දෙපාර්තමේන්තුවල සේවය කරන අය තම ආයතන ප්‍රධානීන් මගින් අයදුම් පත් එවිය යුතුය. ඥාතීන් නොවන ඔබ පිළිබඳව විමසිය හැකි දෙදෙනෙකු ඇතුලත්ව සම්පූර්ණ විස්තර සහිත අයදුම් පතක් තමා විසින් සහතික කරන ලද සහතික වල පිටපත් සමග **2022 මැයි මස 06** වන දිනට **ප්‍රථම සභාපති, ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය , නො 971, ශ්‍රී ජයවර්ධන පුර මාවත, වැලිකඩ, රාජගිරිය** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඊට අමතරව අයදුම් පතෙහි පිටපතක් **naitahrm@gmail.com** යන විද්‍යුත් ලිපිනයට ලිපි කවරයේ ඉහල වම් කෙළවරෙහි අයදුම් කරන තනතුර සඳහන් කළ යුතු අතර කෙටි ලැයිස්තුගත කරන ලද අයදුම් කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.

සභාපති
ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය
නො 971 , ශ්‍රී ජයවර්ධන පුර මාවත,
වැලිකඩ ,රාජගිරිය
දුරකථන 011 2888782 -5

www.naita.gov.lk